# ශ්‍රී ලංකාවේ පුරාණවාරි කර්මාන්තය සඳහා දැව භාවිත කර ඇති ආකාරය පිළිබඳ විමසුමක්

**සී.ආර්. විතානාච්චි**
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය,
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
chandanawithanachchi@gmail.com

ප්‍රමුඛ පද: දැව, අමුණු බැම්ම, වාරි කර්මාන්ත, නිර්මාණාත්මක සැළසුම්

## හැඳින්වීම

ප්‍රාථමික අවධියේ සිටම මිනිසා තමාගේ ජීවන අවශ්‍යතාවන් ඉටුකර ගැනීම පිණිස විවිධාකාර අයුරින් දැව භාවිත කොට ඇත. ශිෂ්ටාචාරාත්මක අවධිය වන විට දැව භාවිතය තුළ අවශ්‍යතාවන් බහුල වන අතර ම එය විධිමත් තත්ත්වයකට ද පත්විය. ශක්තිමත් බව, බහුලව සපයා ගත හැකි බව, අවශ්‍ය පරිදි හැඩගසා ගැනීමේ හැකියාව හා ප්‍රවාහනයේ දී පවතින පහසුව වැනි ගුණාංග දැව බහුල ව භාවිත කිරීමට හේතු වී තිබේ. දැව භාවිතය තුළ පැරැන්නන්ගේ හැකියාව වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් කෙරෙහි පමණක් නොව වාරි කර්මාන්ත විෂයෙහි ද පැවති බවට සාක්ෂි හඳුනා ගැනීමේ හැකියාව පවතී. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පුරාණ වාරි කර්මාන්තයෙහි ලා දැව උපයෝගී කරගැනීම පුරාවිද්‍යාත්මක දෘෂ්ටියෙන් විමර්ශනය කිරීම ය. වාරි පුරාවිද්‍යාත්මක සාක්ෂි ඇසුරින් ඒ සම්බන්ධයෙන් කරුණු තහවුරුවක් ඉදිරිපත් කිරීමත් අපේක්ෂිත ය. වාරි කර්මාන්තයෙහි ලා පුරාතනයේ දී දැව භාවිත කිරීම කුමන කාර්යයන් වූයේ ද යන්න පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ ගැටළුව ලෙස හඳුනාගත හැකිවේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයන මත පදනම්ව සිදුකරන ලද්දක් විය. වයඹ දිග ප්‍රදේශයේ පිහිටි පුරාණ වාරි කර්මාන්තවල අවශේෂ මෙම අධ්‍යයනය සඳහා පාදක විය. සරල අහඹු ක්ෂේත්‍ර ගවේෂණය මෙහි දත්ත එකතු කිරීමේ ක්‍රමවේදය විය. මීට අමතරව වංසකතා ඇතුළත් ප්‍රාථමික මූලාශ්‍රයන් ද, පර්යේෂණ තොරතුරු ඇතුළත් ද්විතියික මූලාශ්‍රයන් ද මෙම පර්යේෂණ සඳහා දායක කරගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ඉදිකිරීම් මාධ්‍යයක් වශයෙන් දැව භාවිතයට ගැනීමේ ඉතිහාසය පූර්ව අනුරාධපුර අවධිය තෙක් ම දිවයන බවට අනියම් තොරතුරු වංසකථා ඇසුරින් හඳුනා ගැනීමේ හැකියාව

පවතී. අනුරාධපුර යුගයේ ඉදිකිරීම් සඳහා දැව බහුල වශයෙන් භාවිත කර තිබුණු බව වංසකථා මෙන් ම පුරාවිද්‍යාත්මක සාක්ෂි ද ලැබේ. දුටුගැමුණු රජු විසින් කරවන ලද ලෝහ ප්‍රසාදයේ උඩුමහල් දැවයෙන් කරවන ලද නිර්මාණයන් ලෙස සැලකිය හැකි වේ (*මව*.xxvi: 3-45). පැරණි ගොඩනැගිලි නටබුන් ආශ්‍රයෙහි තිබෙන දැව බාල්ක ආදිය රැඳවීමට යොදා තිබූ සිදුරු, ගල් කණු මත යෙදූ කප්පිලි ලකුණු ආදිය පුරාවිද්‍යාත්මක සාක්ෂි ලෙස හඳුනා ගත හැකි ය.

දැව භාවිතය තුළ පැරැන්නන්ගේ හැකියාව වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් කෙරෙහි පමණක් නොව වාරි කර්මාන්ත විෂයෙහි ද පැවති බවට සාක්ෂි හඳුනා ගැනීමේ හැකියාව පවතී. ඒ සඳහා ජලයට ඔරොත්තු දෙන දැව වර්ග භාවිතයට ගන්නට ඇත. වැව් ආශ්‍රිත දැව භාවිතය සොරොව් දොරටුව සඳහා ද, පිටවානෙහි ආවරණය පිණිස ද යොදාගෙන තිබෙන බව ඇතැම් පැරණි වැව්වල දක්නට ලැබෙන සොරොව්ව ආශ්‍රිත බිසෝකොටුවේ සැකැස්මේ ව්‍යුහය හා පිටවානේ පාෂාණ ස්තරය මත යොදා තිබෙන කාණු සළකුණුවල රටාව අනුව අනුමාන කිරීමට පුළුවන. පඬුවස්නුවර පඬා වැවේ පුරාණ පිටවානේ යොදා තිබෙන කාණු රටාව අනුව පැහැදිලි වන්නේ එම ස්ථානයේ දැව භාවිතයෙන් අවශ්‍ය විටෙක වාන උස්කොට ආවරණය කිරීමේ ක්‍රමවේදයක් පැවති බව ය.

අර්ධ ස්ථාවර අමුණු ඉදිකිරීම සඳහා දැව ප්‍රධාන මාධ්‍යයක් ලෙස අතීතයේ සිට ම යොදාගන්නට ඇත. ශිලා ලේඛන හා වංසකථාවල දැක්වෙන ඇතැම් අමුණු තිබුණේ යැයි දැක්වෙන ස්ථානවල ගලින් කළ අමුණක කිසිදු සාධකයක් හමුනොවීමෙන් අනුමාන කළ හැක්කේ එම අමුණ දැවයෙන් ඉදිකරන්නට ඇති බව ය. මින්විල ශිලා ලේඛනයෙහි (*Ic.* Vol. ii: No.01) දැක්වෙන කුටකණ්ණතිස්ස රජු විසින් කරවන ලද ඇළ මාර්ගයක් සඳහා මහවැලි ගඟ හරස්කොට තාවකාලික දැව අමුණක් ඉදිකරන්නට ඇති බවත් සෑම ගංවතුරකින් පසු එය අලුත්වැඩියා කරන්නට ඇති බව නිකලස් පෙන්වා දී ඇත (නිකොලස් 1979:48). අමුණු නිර්මාණය සඳහා දැව භාවිත කළ බව සනාථ කිරීමට හැකි පැහැදිලි සාක්ෂි මෙම අධ්‍යනයේ ප්‍රතිඵල ලෙස අනාවරණය කර ගැනීමට හැකි විය.

දැදුරු ඔය ආශ්‍රිත ව එවැනි දැව අමුණු කිහිපයක් ම තිබුණු බවට සාක්ෂි හමුවීය. පල්ලම ප්‍රදේශයේ මොලඑළිය **මංකඩ අමුණ** හා මුගුණුවටවන ආසන්නයේ පිහිටි **මහමංකඩ අමුණ** දැව භාවිතයෙන් ඉදිකළ පුරාණ අමුණු සඳහා නිදසුන් වේ. දැව භාවිතයේ දී වුව ඒ සඳහා අනුගමනය කර තිබෙන සැළසුම් එකිනෙකට වෙනස් ආකාරයක් ගන්නා බව හඳුනාගත හැකි විය. අමුණක් ඉදිකිරීමේ අවශ්‍යතාව පැවති ඇතැම් ස්ථානවල ශෛලමය අමුණක් ඉදිකිරීමට සුදුසු භූ පිහිටීමක් නොමැති අවස්ථාවල දැව

භාවිතයෙන් අර්ධ ස්ථාවර අමුණු ඉදිකර තිබෙන බව පෙනේ. එවැනි ස්ථානවල ගං පතුලේ වැලි තට්ටුවට යටින් ඝනකමට තැන්පත් වී තිබෙන මැටි ස්තරය ප්‍රයෝජනයට ගැනීමෙන් දැව කණු භූමිය සමග සම්බන්ධකර තිබේ. දැව කණු එකිනෙකට සමීප ව වේල්ලක ආකාරයට භූමියේ සිටුවීමෙන් මොළඑලිය මංකඩ අමුණ නිර්මාණය කර තිබේ. මහ මංකඩ අමුණ දැදුරු ඔය හරහට සිටුවන ලද විශාල සිරස් දැව කණු අතරට තිරස් අතට රඳෙන පරිදි ලෑලි යෙදීමෙන් ඔය හරස්කොට අනතුරු ව ඊට ඇතුළතින් පස් හෝ මැටි දමා තද කිරීමෙන් ඉදිකරන්නට ඇති බව අනුමාන කළ හැකි ය. දැව කණු ශක්තිමත් ව පොළවේ ගිල්වීම සඳහා දැව කණුවේ පහළ කෙළවර හොඳින් උල්කර යකඩ කොපු යොදා ඇත. එවැනි යකඩ කොපු මෙම ස්ථානයෙන් සොයාගැනීමට හැකිවීම වැදගත් සාක්ෂියක් ලෙස සැලකිය හැකි වේ.

පුරාණ දැව අමුණු සඳහා ජලයේ දී නොදිරණ හොර, කුඹුක් වැනි දැව වර්ග යොදාගෙන තිබෙන බව ඉහත පුරාණ අමුණ ආශ්‍රයෙන් ලබාගත් දැව සාම්පල නිරීක්ෂණයෙන් නිගමනය කළ හැකි විය. මොළඑලිය මංකඩ අමුණ සඳහා විශාල ප්‍රමාණයේ දැව කණු මෙන් ම කුඩා ප්‍රමාණයේ දැව කණු ද යොදාගෙන තිබෙන මුත් මහමංකඩ අමුණ සඳහා භාවිත කර ඇත්තේ එක ම ප්‍රමාණයේ ඍජු දැව කණු පමණි. මෙම දැව අමුණු යාවත්කාලීන නොවන්නට ඇති අතර වරින්වර අලුත්වැඩියා කරමින් භාවිත කරන්නට ඇති බව සිතිය හැකි වේ.

ප්‍රධාන අමුණු බැම්ම සඳහා දැව යොදාගැනීමට අමතර ව ගලින් කළ අමුණු සඳහා ද දැව භාවිත කළ බවට අනුමාන කළ හැකි සාක්ෂි පුරාණ අමුණු ආශ්‍රිත ව හමු වී තිබේ. ස්වාභාවික ගල් වැටියක් පාදක කරගෙන ඉදිකරන ලද දැදුරු ඔය වැලි මළුව අමුණේ ඇතැම් ස්ථාන ආවරණය කිරීම සඳහා දැව කණු හා ලෑලි යොදාගන්නට ඇති බව එම ගල් වැටියේ සමාන්තර ව යොදා තිබෙන තරමක් ගැඹුරැති හතරැස් සිදුරුවලින් නිගමනය කළ හැකි ය. එම සිදුරු යොදා ගනිමින් සිරස් අතට සිටුවන ලද හතරැස් දැව කණු අතරට තිරස් ව ලෑලි දමා ස්වාභාවික ගල් වැටියේ විවෘත කොටස් ආවරණය කර තිබෙන්නට ඇති බව සිතිය හැකි වේ. මීට අමතර ව අමුණු ආශ්‍රිත ව තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි පිටාර දොරටු ආවරණය කිරීම සඳහා ලෑලි යොදාගන්නට ඇති බව පිටාර දොරටු සඳහා යොදාගන්නට ඇතැයි අනුමාන කළ හැකි ගල් කණුවල යොදා තිබෙන සිදුරුවල රටාවන් අනුව නිගමනය කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


නිකලස්, සී. ඩබ්ලියු.1979,පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය, ***රාජකීය ආසියාතික සමිතියේ ශ්‍රී ලංකා ශාඛාවේ සඟරාව,*** පරිවර්තනය.

***මහාවංසය*** (සිංහල), 1967,සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි,

බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව.

***Inscription of Ceylon Vol. ii. Part ii.***,2001, S. Paranavitana, eds. Malini Dais, Colombo, Archaeological Survey Department.